2019 නොවැම්බර් මස 04 වැනිදා



# ඒ කාලෙ හොරෙන් තැඹිලි කඩලා පාටි දැම්මා




**මෙවර අප විශේෂාංගය හා එකතු වන්නේ ප්‍රවීණ රංගන ශිල්පී ධර්මප්‍රිය ඩයස්**

**ඉලන්දාරි කාලෙ**

මොලේ කල්පනා කරනවට වඩා ඇගේ පතේ හයිය පෙන්නල ජීවත් වෙන්න පුළුවන් කියල තමයි ගොඩක් වෙලාවට හිතුවෙ. කලබලකාරී වගේම කලහකාරී චරිතයක්. රණ්ඩුවක් වෙන්නෙ කොතනද, මම එතන. ඇත්තම කිව්වොත් නාහෙට ඇහුවෙ නෑ.

**පාසල් ජීවිතේ**

කොලඹුන්නෙ සර් ජෝන් කොතලාවල විදුහලෙන් තමයි මූලික අධ්‍යාපනය හැදෑරුවේ. සාමාන්‍ය පෙළ විභාගයෙන් පස්සෙ පිළියන්දල සෙන්ට්‍රල් එකට ගියා. රඟපාන පිස්සුව තදේටම තිබුණා. ඒත් එක්කම සිංදු කියල නටල දඟලල හිටියා. අධ්‍යාපන කටයුතු පාඩු කර ගත්තෙත් නෑ. චිත්‍රවලට අත්වැඩවලට වැඩිපුර ලකුණු ලබා ගත්තා. පාසලේ සමිති සමාගම්වල ක්‍රියාකාරී සාමාජිකයෙක්.

**ඇසුරු කරපු යාළුවෝ**

කොඟයක් හිටියා. ඒ අයගෙන් පුෂ්පෙ, ගිහාන්, තනුජ තමයි ළඟින්ම හිටියේ. අපි හතරදෙනා සෙට් වෙලා තමයි සිංදු කියන්නෙ. නාට්‍ය රඟදක්වන්නෙ. අදටත් අපි හතර දෙනා ළඟින් ඇසුරු කරනවා. ගෙවල් පැත්තෙ හිටියා සුරංග, සෙනරත් කියලා යාළුවො දෙන්නෙක්. ඒ දෙන්න තමයි මගේ ජීවිතේ වෙනස් කරපු දෙන්නා. සෙනරත් තමයි මාව පිළියන්දල සෙන්ට්‍රල් එකට ඇතුළත් කරන්න අම්ම තාත්ත වගේ වැඩ කටයුතු කළේ. ඒ නිසා තමයි මට නාට්‍ය ක්ෂේත්‍රයට එන්නත් පුළුවන්කම ලැබුණෙ.

**කල්ලි ගැහුනු තැන්**

කැස්බෑව හන්දියේ බෝක්කුව උඩ. එතන තිබුණා සිරිල් අයියගෙ කඩේ. ඒකට තමයි චිත්‍රකතා පත්තර සේරම එන්නේ. අපි කට්ටිය සෙට්වෙලා සත 50 රුපියල දාල හැම පත්තරයක්ම වගේ අරන් කියවනවා. ගෙවල්වලට හොරෙන් කැස්බෑව වැව ළඟදී සෙට් වෙලා හැම දේම කතාබහ කරගෙන අන්තිමට වැවෙන් නාලා ගෙදර එනවා.

**කරපු දඟවැඩ**

අහල පහල තැඹිලි කුරුම්බා හොරෙන් කඩන එක ඉස්තරම්ම විදියට කළා. ඒ කාලේ තැඹිලි කුරුම්බ පාටි දානවා. අද මගෙන් නම් හෙට තව යාළුවෙකුගෙන් කිසිම වියදමක් නෑ. මොකද අනුන්ගෙන් හොරෙන් කඩන ඒවනේ. කැස්බෑවෙ විජයසුන්දරාරාමයේ බුද්ධ පූජාව හොරෙන් කෑවෙ නැත්නම් ඒ කාලෙ අපේ බඩ පිරෙන්නෙ නෑ.

**කරපු හොඳ වැඩ**

වෙසක් එකට ගමේ වැඩිමල් කට්ටිය කරගෙන ආපු කිරි කෝපි දන්සලක් කරන්න අපට අවස්ථාව දුන්නා. අවුරුදු 16 ක් විතර ඒක බොහොම කැපවීමෙන් අපි කළා. සමිති සමාගම් පිහිටුවාගෙන ගොඩක් පොදු වැඩ ශ්‍රමදාන වගේ දේවල් අපි කළා.

**කැස්බෑව හන්දියේ බෝක්කුව උඩ. එතන තිබුණා සිරිල් අයියගෙ කඩේ. ඒකට තමයි චිත්‍රකතා පත්තර සේරම එන්නේ. අපි කට්ටිය සෙට්වෙලා සත 50 රුපියල දාල හැම පත්තරයක්ම වගේ අරන් කියවනවා.**

**පටබැඳුණු නම්**

සර් ජෝන් කොතලාවල විදුහලේ ඉගෙනුම ලබන කාලෙ ඉඳල ඇගේ පතේ හයිය පෙන්නුව වැඩි නිසා යකඩය කියල තමයි මට නම දාල තිබුණෙ. අම්මා තාත්ත ගෙදරට අසෝක කියලා නම දාගෙන හිටියා. මගේ නෝන නම් අදටත් මට කතා කරන්නෙ අසෝක අයිය කියලා. අනිත් හැමෝම අතරෙ මම ඩයස් - ඩයියා

**අහපු කයි කතන්දර**

ඒ කාලෙ ඉතින් රස්තියාදු ගැහිල්ලයි ගෝරි දාගැනිල්ලයි නිසා ගෙදරින් නිතරම බැනුම්. හදන්න බෑ මග්ගොන දාන්න ඕන. නැත්නම් කරවල වාඩියකට යවනව කියල. රස්තියාදුකාරයො මැරැට්ටියො කියල හරියට චෝදනා තිබුණා.

**ගැහැනු ළමයින්ගෙ ආශ්‍රය**

ගොඩ දෙනෙක් ආශ්‍රය කළා. ගෙවල් පැත්තෙ හිටියා කාංචනා ගංගා කුමාරි කියල යෙහෙළියක්. ඇය තමයි මාව මුතුහර නාට්‍යවලට සම්බන්ධ කරගත්තෙ ඒ කාලෙ. මේ වෙද්දී බැඳල නුවර පැත්තෙ පදිංචිය. අදටත් මගේ හොඳම යෙහෙළියක්. මේ ළඟදීත් මගේ නාට්‍යයක් බලන්න ආවා.

**කරපු විලාසිතා**

මාෂල් ආර්ට්වලට තිබුණු කැමැත්ත නිසා මම බෲස්ලි වගේ අඳින්න ගොඩක් ආසා කළා. ඒත් අපට ඕන ඕන දේවල් ඒ කාලේ ලැබෙන්නෙ නැහැ. ඒත් කොහොම හරි ඒවා ඇන්දා. වයිනිස් කොලර් දාල මහපු ෂර්ට් අඳින්න ලොකු කැමැත්තක් තිබුණා. ඒවත් කොහොම හරි ඇන්දා.

**තිබුණ බලාපොරොත්තු**

පිළියන්දල සෙන්ට්‍රල් යන කාලෙ නාට්‍ය කාරයෙක් වෙන්න ඕනමයි කියන එක ලොකුවට හිතට වැදිලා තිබුණා. හැම දේම කළේ ඒ සිහිනය සැබෑ කරගන්න. කොහොම හරි ඒ බලාපොරොත්තුව ඉටුවුණා.

**දුක හිතුන අවස්ථා**

පුට් සයිකලයක් ගන්න මම පුදුම ධෛර්යයක් ගත්තා. ඒ කාලෙ රුපියල් 300 යි. තැන් තැන්වලට යනව. සයිකල් අතගාල බලල එනවා. ඒ ගැන ලොකු දුකක් තිබුණ හිතේ. උසස් පෙළ කරද්දී මම කොහොම හරි පුට් සයිකලයක් ගත්තා. ඒත් එනකොට මගේ හිතේ තිබුණ ආසාව ගිහින්.

**සැබෑ නොවුණ හීන**

මගේ අම්මගෙ ගම නුවර. ඇය ආසාවෙන් හිටිය මාලිගාවට යන්න. මම හීන මැව්ව ඇයව දළදා මාලිගාවට එක්ක යන්න. ඒත් ඇය මැරෙනකම් මට ඒ දේ කරන්න ලැබුණෙ නෑ. ඒ ගැන අදටත් දුකයි.

**අමතක නොවන සිදුවීම්**

අද මගේ බිරිඳව ඒ කාලෙ පෙම්වතිය කරගන්න මම අවුරුදු දෙකක් විතර ට්‍රයි කළා. දවසක් හවසක මම නාරාහේන්පිටට යන අතරේ ඇය මට කැමැත්ත ප්‍රකාශ කළා. වැස්ස දවසක්. එත් මට වැස්ස කියල දැනුනෙ නෑ. හිතේ තිබුණ සතුට වැඩිකමට ඔහේ ගියා තෙමීගෙන. නලින් තලගල කියල මගේ මිතුරෙක් ඇහුවා "ඈ යකෝ උඹට පිස්සුද ඔහොම තෙමෙන්නෙ"

○ ධම්මික හේවාවසම්

Scan with EasyScan